## ආදායම් සහතික නිකුත් කිරීම

## අවශ්‍ය ලියවිලි

1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත් අයදුම්පත අයදුම්කරු විසින් සම්පූර්ණ කර ග්‍රාම නිලධාරීගේ නිර්දේශය ලබා ගෙන රැගෙන ආ යුතුය.

2. මාසික ආදායම රු. 10,000/- සහ ඊට වැඩි අගයන් සඳහා ආදායම් සහතික ඉල්ලුම් කිරීමේදී ව්‍යාපාරයක් සම්බන්ධයෙන් නම්, ව්‍යාපාර ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. එම සහතිකය මාස 06 ක් වත් පැරණි විය යුතුය. එසේම ප්‍රාදේශීය සභාවෙන් හෝ නගර සභාවෙන් ලබා ගත් මෙම වර්ෂයට අදාළ වෙළඳ බලපත්‍රයේ පිටපතක්ද ඉදිරිපත් කළ යුතුය. ව්‍යාපාරය පිහිටා ඇත්තේ මෙම කොට්ඨාශයෙන් පිටත නම්, එය පිහිටා ඇති වසමෙහි ග්‍රාම නිලධාරී විසින් ලබාදෙන ලද (අදාල ප්‍රාදේශීය ලේකම් අනු අත්සන සහිත) ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

3. නිවසක් කුලියට දීම, බදු දීම ආදියේදී නිවැරදිව සකස් කරන ලද කුළී ගිවිසුමක්, බදු ගිවිසුමක් ග්‍රාම නිලධාරී විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය. අදාල දේපල පිහිටා ඇත්තේ මෙම කොට්ඨාශයේ නොවන විට දේපලට අදාලව පත්තිරු පිටපත්ද ලබාදිය යුතුය. එසේම එම දේපලෙහි වටිනාකම පිළිබඳ ග්‍රාම නිලධාරී විසින් ලබා ගත් තහවුරුවක්ද ලබා ගත යුතුය.
4. රියදුරු රැකියාව සඳහා ආදායම් සහතිකයක් ඉල්ලුම් කිරීමේදී
   - වාහනය ලියාපදිංචි කිරීමේ සහතිකය
   - වාහනයේ ආදායම් බලපත්‍රයේ ඡායා පිටපතක්
   - අදාල අයගේ රියදුරු බලපත්‍රයේ ඡායා පිටපත
   - වාහනය වෙනත් අයෙකුගේ නම් එය ධාවනය කිරීම සම්බන්ධයෙන් රියදුරුට ලබා දී ඇති ලිපියක් ඉදිරිපත් කළයුතුය.

5. වෘත්තීන් සඳහා (පෙදරේරු, කුලී, වඩු කාර්මික ආදී වශයෙන්) ග්‍රාම නිලධාරී විසින් නිර්දේශ කරන ලද ආදායම් සහතික අයදුම්පත ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

**වරිනාකම් සහතික නිකුත් කිරීම**

**අවශ්‍ය ලියවිලි**

- අයදුම්කරු සතු ඉඩමේ ඔප්පුවේ පිටපත සහ අදාල ඉඩම් ඔප්පුවේ පිඹුරුපත

- සති දෙකක් ඇතුළතදී ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබා ගත් ඔප්පුවේ පත් ඉරුවක්

- ග්‍රාම නිලධාරී විසින් අයදුම්පත විධිමත් සටහනක් මගින් නිර්දේශ කර තිබීම

**නොමිලේ ලබා දෙන තක්සේරු වාර්තා**

**අවශ්‍ය ලියවිලි**

- අයදුම්කරු විසින් තමන් සේවය කරන රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයේ ප්‍රධානියා වෙතින් තමන් මිලදී ගැනීමට අපේක්ෂා කරන ඉඩමේ තක්සේරු වාර්තාව ලබා දෙන ලෙස ඉල්ලීමක් කළ යුතුය.

- එම ඉඩමේ ඔප්පුවේ පිටපත සහ අදාල ඉඩම් ඔප්පුවේ පිඹුරුපත (පළාත් පාලන ආයතනයෙන් අනුමත කරන ලද)

- ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබා ගත් ඔප්පුවේ පත් ඉරුවක්

- ග්‍රාම නිලධාරී විසින් අයදුම්පත සම්පූර්ණ කර නිර්දේශ කර තිබීම